**වහලයමත සවිකරණ සූර්ය බලශක්ති උත්පාදන යන්ත්‍ර ණයමාලා ව්‍යාපෘතිය - 2019**

---

වහලයමත සවිකරණ සූර්ය බලශක්ති උත්පාදන යන්ත්‍ර ණයමාලා ව්‍යාපෘතියේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ අරමුදල් උපයෝජනය කිරීම පිළිබඳ ප්‍රකාශනය, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2018 සැප්තැම්බර් 18 දින එළඹි අංක. එස්ආර්අයි - 3571 දරන ණය ගිවිසුමේ 03 වන උපලේඛනයේ 27 (අ)වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර, සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ප්‍රධාන ධාරාවේ පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය, විදුලිබල උත්පාදන ධාරිතාව ඉහළ නැංවීම සහ රටේ පාරිසරික තත්ත්වයන් වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් සංරචක තුනක් යටතේ ක්‍රියාත්මක වේ. එනම් , ගොඩනැගිලිවල සවිකරණ සූර්ය බලශක්ති උත්පාදනය වැඩි කිරීම සඳහා ණය අරමුදල් සම්පාදනය, පියැසි මත සූර්ය විදුලි උත්පාදන වෙළඳපල යටිතල පහසුකම් සහ ලාභ ලැබියහැකි උප ව්‍යාපෘති නල මාර්ගය සංවර්ධනය කිරීම සහ මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය, සහභාගීත්ව මූල්‍ය ආයතන සහ වාණිජ හා ගෘහස්ථ අංශයේ ගනුදෙනුකරුවන් ඇතුළු පාර්ශවකරුවන්ගේ ධාරිතාව සහ දැනුවත්භාවය ඉහළ නැංවීම වේ. ව්‍යාපෘති පරිපාලන අත්පොත අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 7,550 කට සමාන එ.ජ.ඩො. මිලියන 50 ක් වූ අතර මෙය මූල්‍යායනය කිරීමට ආසියානු සංවර්ධන බැංකුව විසින් එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2019 අප්‍රේල් 17 දින ආරම්භ කරන ලද අතර 2021 දෙසැම්බර් 31 දින වන විට නිම කිරීමට නියමිතය.

## 1.3 මතය

---

වහලයමත සවිකරණ සූර්ය බලශක්ති උත්පාදන යන්ත්‍ර ණයමාලා ව්‍යාපෘතියේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදල් උපයෝජනය කිරීම පිළිබඳ ප්‍රකාශනය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අනුකූලව සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

---

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

---

මෙම අරමුදල් උපයෝජනය කිරීම පිළිබඳ ප්‍රකාශනය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව අරමුදල් උපයෝජනය කිරීම පිළිබඳ ප්‍රකාශනය පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

----------------------------------------------------------------

සමස්තයක් ලෙස අරමුදල් උපයෝජනය කිරීම පිළිබඳ ප්‍රකාශනය, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම අරමුදල් උපයෝජනය කිරීම පිළිබඳ ප්‍රකාශනය පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් අරමුදල් උපයෝජනය කිරීම පිළිබඳ ප්‍රකාශනයේ ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරන ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත් අරමුදල් උපයෝජනය කිරීම පිළිබඳ ප්‍රකාශනයේ ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් අරමුදල් උපයෝජනය කිරීම පිළිබඳ ප්‍රකාශනයේ ඇතුළත් බව ඇගයීම.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. භෞතික කාර්ය සාධනය

### 2.1 ව්‍යාපෘතිය ආරම්භ කිරීමේ ප්‍රමාදය

| අංකය | කාර්යයන් | ආරම්භ කිරීමට නියමිත දිනය | ආරම්භ කළ දිනය | ප්‍රමාදය | බලපෑම් | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|---|---|---|
| 01 | ව්‍යාපෘති අධීක්ෂණ ඒකකය පිහිටුවීම | 2017 ජූලි | 2018 දෙසැම්බර් | මාස 17 | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම ප්‍රමාද වීම. | ව්‍යාපෘති අධීක්ෂණ ඒකකය පිහිටුවීමට පෙර ණය ගිවිසුම අත්සන් කිරීමට අවශ්‍ය විය. | ව්‍යාපෘති සංරචක නියමිත පරිදි ක්‍රියාත්මක කළ යුතුය. |
| 02 | ණය ගිවිසුම අත්සන් කිරීම | 2017 ඔක්තෝබර් | 2018 සැප්තැම්බර් | මාස 12 | -එම- | ප්‍රමාද කාලය තුළ නීතිපති තුමා සමඟ රැස්වීම් කිහිපයක් පැවැත්වීමට සිදුවිය. | -එම- |

### 2.2 ව්‍යාපෘතියේ භෞතික කාර්ය සාධනය

| කාර්යය | 2019 දෙසැම්බර් 31 දිනට අපේක්ෂිත භෞතික කාර්ය සාධනය (ඒකක) | 2019 දෙසැම්බර් 31 දිනට අත්කරගත් කාර්යය සාධනය (ඒකක) | ප්‍රමාදය / විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|---|---|
| ණය ප්‍රතිමූල්‍යකරණය | 1162 | 1020 | ණය 142 ක් ප්‍රතිමූල්‍යකරණය කර නොතිබුණි. | සූර්ය බලශක්ති උත්පාදනය ප්‍රමාද වීම. | ශ්‍රී ලංකා මහ බැංකුව 2019 දෙසැම්බර් 31 දිනට පෙර ගිණුම් වසා දැමීම හා අයවැය ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හේතුවෙන් අනුමත කරන ලද මුළු ණය මුදල ප්‍රතිමූල්‍යකරණය කර ගත නොහැකි විය. | අයවැය ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම භාවිතා කිරීමට පියවර ගත යුතුය. |